# නව වසර තුනකින් ජනගහනයෙන් ගම්පහ කොළඹ පරදනවා

## ● කොළඹ විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා

**නිශානි හේරත් බන්නැහැක**

වසර 2022 වනවිට ගම්පහ දිස්ත්‍රික්කය, මිලියන 2.77 ජනතාවක් ජීවත්වන ලංකාවේ ජනගහනය අධිකම දිස්ත්‍රික්කය වන බවත්, මිලියන 2.56 ජනතාවකින් යුත් කොළඹ දිස්ත්‍රික්කය දෙවැනි තැනටත් පත්වන බව, කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රජාවිද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ පර්යේෂක, සම්මානිත මහාචාර්ය ඩබ්ලිව්. ඉන්ද්‍රලාල් ද සිල්වා මහතා දිනමිණට හෙළිකළේය.

වසර 2012, සංගණනයට අනුව බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ මිලියන 2.32ක් (11.4%) ගම්පහ දිස්ත්‍රික්කයේ මිලියන 2.30 (11.3%ක්) හා කළුතර දිස්ත්‍රික්කයේ මිලියන 1.22ක් (6%) වාර්තාවූ බවත් රටේ ජනතාවෙන් 29%ම බස්නාහිර පළාතේ ජීවත්වූ බව හෙළි කළේය.

ඒ අනුව 2001 - 2012 තුළ කොළඹ දිස්ත්‍රික්කයේ 0.35%ක්, ගම්පහ 1.03%ක් හා කළුතර 1.28% ජනගහනයක් වර්ධනයක් වූ බව කීය. මේ අතරින් 40% ම, බස්නාහිර පළාතට ඇතුළු සංක්‍රමණිකයන් ලෙස පැමිණි අතර එයින් වැඩිම ප්‍රමාණයක් ගම්පහට සංක්‍රමණයවී ඇති බවද සඳහන් කළේය.

මේ අනුව බස්නාහිර පළාතේ 2012 වනවිට මිලියන 5.85ක් වූ ජනගහනය 2022 වනවිට මිලියන 6.73ක් වන බවත් එයින් ගම්පහ 2.77%ක් කොළඹ 2.56%ක් හා කළුතර 1.4%ක් වන බවද පැවසීය. එසේම 2032දී බස්නාහිර පළාතෙන් ගම්පහ 3.25%ක් කොළඹ 2.73ක් හා කළුතර 1.58ක් ලෙසින් සිටින බව දක්විය හැකිය.

ජන ඝනත්වය කොළඹට වඩා ගම්පහ දිස්ත්‍රික්කයේ අඩුවීම, කොළඹට කඩිනමින් ළඟාවීමේ පහසුකම් තිබීම, සෞඛ්‍ය, අධ්‍යාපන ඇතුළු අනෙකුත් පහසුකම් පහසුවෙන් ළඟාකරගැනීමට හැකිවන නිසා වැඩි ප්‍රතිශතයක් ගම්පහ දිස්ත්‍රික්කය ජීවත්වීම සඳහා තෝරාගත් බවත් කීය.

කොළඹ දිස්ත්‍රික්කය තුළ වර්ග කිලෝමීටරයකට 3500 පමණ අධික ජන ඝනත්වයක් පවතින බවත් ගම්පහ දිස්ත්‍රික්කයේ එය වර්ග කි. මීටරයකට 1700 පමණ වන බවත් හෙළිකළේය. දැනට කොළඹ නාගරික සීමාවේ 70% පමණ අධික ජනඝනත්වයකුත් ගම්පහ 16% පවතින බවත් කීය.

නමුත් යුද සමයේ කොළඹට උතුරු, නැගෙනහිර ප්‍රදේශවලින් සංක්‍රමණයවූ පිරිස් නැවත උතුරු කලාපයට සංක්‍රමණය වී තිබීම හා කොළඹ නාගරිකයේ විශාල පිරිසක් විදෙස් රටවලට සංක්‍රමණය වීම නිසා ගම්පහට සාපේක්ෂව කොළඹ ජනගහනයේ අඩුවක් පෙන්වන බවද පැහැදිලි කළේය.

කොළඹ ජීවත්වන ජනතාවගේ ආයු අපේක්ෂාව අඩුවීම හා කොළඹ දිස්ත්‍රික්කයේ ස්වභාවික දරු උපත් වර්ධන වේගය අඩුවීමත්, ඉදිරියේදී කොළඹ ජනගහනය අඩුවීමට හේතුවක් බවද කීය.